# 11ශ්‍රේණිය

# ගෘහ ආර්ථික විද්‍යාව

නිපුණතාවය 12

නව යෞවන අවධියේදී මුහුණ පෑමට සිදුවන වෙනස්කම් වලට අනුවර්තනය වෙයි.

නිපුණතා මට්ටම:- 12.2
යෞවන අවධිය තුළ සිදුවන සංවර්ධනය පිළිබ!ද විමසිලිවමත් වෙයි.

# ක්‍රියාකාරකම් පත්‍රිකාව

පාඩම :- නව යෞවන අවධියේ සිදුවන සංවර්ධනය.

නම:- **H.M.B.Menike**
මිනු/මාරපොල මහා විද්‍යාලය, මාරපොල.

## ප්‍රශ්න සියල්ලටම නිවැරදි පිළිතුරු තෝරන්න
## 1.1 කොටස

(1) යොවුන් වියේ දරුවාගේ සංවර්ධනයට බලපාන්නා වූ වැදගත් සාධකයකි.

1 ආරය හා සමාජය  2 පරිසරය හා සමාජය
3 පරිණතිය හා ඉගෙනීම  4 සමාජය පරිණතිය

(2) ලෝක සෞඛ්‍ය සංවිධානය හඳුන්වා දෙන වයස් සීමාව තෝරන්න.

1 වයස අවුරුදු 10-19 දක්වා  2 වයස අවුරුදු 10-21 දක්වා
3 වයස අවුරුදු 11-20 දක්වා  4 වයස අවුරුදු 11-19 දක්වා

(3) යොවුන් වියේ කායික වර්ධනය සම්බන්ධ සාවද්‍ය වරණය තෝරන්න

(1) යොවුන් වියේ ගැහැණු දරුවකුගේ උපරිම වර්ධන නැග්ම සිදුවන්නේ අවුː 12 දීය.
(2) පිරිමි දරුවකු උපරිම වර්ධන නැග්ම සිදුවන්නේ අවුː 14 දීය
(3) අවුː 14 දී ගැහැණු දරුවා පිරිමි දරුවාට වඩා උසින් බරින් වැඩිවේ.
(4) අවුː 16 වන විට පිරිමි දරුවා ගැහැණු දරුවාට වඩා උසින් බරින් වැඩිවේ.

(4) යෞවනයා තුළ ගවේෂණයට, පර්යේෂණයට, වගකීම් භාරගැනීම් න්‍යායාත්මක දැණුම පිළිබඳ හැකියා, නිර්මාණශීලිත්වය ඇතිවන්නේ,

1 මානසික වර්ධනය නිසාය  2 බුද්ධි වර්ධනය නිසාය
3 කායික වර්ධනය නිසාය  4 චිත්තවේග වර්ධනය නිසාය

# රචනා ප්‍රශ්න :1.2 කොටස

(1) යොවුන් විය අර්ථ කථනය කරන්න

(2) යොවුන් දරුවාගේ සංවර්ධනයට බලපාන්නාවූ සාධක මොනවාද?

(3) යොවුන් වියේ දරුවකුගේ මානසික වර්ධනයේ හා භාෂා වර්ධනයේ සහ සම්බන්ධතාවක් ඇත. මේ කියමන පැහැදිලි කරන්න.

(4) යොවුන්වියේ දරුවන් සමාජයට යොමුවීමට තදබල උත්සාහයක් දරයි. උදාහරණ 4 ක් ලියන්න.

(5) යොවුන් වියේ දරුවන් සුවිශේෂී සංවර්ධන අවස්ථා පසුකරයි. එම වර්ධන අවධි මොනවාද?

## නිවැරදි පිළිතුර තෝරන්න 2.1

(1) යොවුන්වියේ ප්‍රජනන පද්ධති ක්‍රියාක්මක වීම සිදුවන්නේ

:1- ලිංගික හෝමෝනවල බලපෑම නිසාය :2- ලිංගික පරිණතිය නිසාය

:3- ශාරීරික වර්ධනය නිසාය :4- චිත්තවේග වර්ධනය නිසාය

(2) පිරිමි දරුවන්ගේ ප්‍රජනන හෝමෝනය වනුයේ,

:1- ඊස්ට්‍රජන්ය :2- ඇඩ්‍රිනලින්ය

:3- ප්‍රොජෙස්ටරෝන්ය :4- ටෙස්ටොස්ටරෝන්ය

(3) ප්‍රජනන සෞඛ්‍ය යනු ප්‍රජනන පද්ධතියක හා එහි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පවතින

:1- කායික යහ පැවැත්මය :2- මානසික යහපැවැත්මය

:3- සමාජීය යහපැවැත්මය :4- ඉහත සියල්ලමය

(4) ඒඩ්ස් රෝගය සම්බන්ධ පහත ස!දහන් පිළිතුරු අතරින් සාවද්‍ය පිළිතුර තෝරන්න.

:1- ලිංගික ක්‍රියා මගින් රෝගය ව්‍යාප්ත වේ :2- රුධිර පාලවිලයනය මගින් රෝගය ව්‍යාප්ත වේ

:3- මච්කිරි දීම මගින් රෝගය ව්‍යාප්ත වේ ::4- ආහාරපාන මගින් රෝගය ව්‍යාප්ත වේ.

# රචනා ප්‍රශ්න 2.2

(1) ප්‍රජනන සෞඛ්‍ය යන්න අර්ථකථනය කරන්න

(2) ප්‍රජනන සෞඛ්‍ය පිළිබ!ද අධ්‍යයනය කළැකි තේමා 2 ක් ස!දහන් කරන්න.

(3) ප්‍රජනන සෞඛ්‍ය රැකගැනීම වැදගත් වන්නේ ඇයි? කරුණු 4 ක් ලියන්න.

(4) ඍෂඪ යන්නේහි අදහස පැහැදිලි කරන්න.

.(5) ලිංගික සම්ප්‍රේෂණ ආසාදනවල ලක්ෂණ 4 ක් ලියන්න.

## පිළිතුරු පත්‍රය

**:1.1 කොටස**

:1 - 3 :2 - 1 :3 -3 :4 - 1

**:1.2 කොටස**

1 වයස අවුරුදු 10 - 19 දක්වා කාල සීමාව යෞවන හෙවත් යොවුන් විය ලෙස හැ!දින්වේ.

2 ආරය හා පරිසරය
පරිනතිය හා ඉගෙනිම

3 මෙම අවධියේ දී වාග්මාලාව පු!ළුල්වීම, කථාව හැකියාව වර්ධනය වීම නිසා ඔවුන්ට පැහැදිලි අදහස් ඉදිරිපත් කිරීමට හැකියාව ඇත. එම නිසා භාෂා වර්ධනය හා මානසික වර්ධනය අතර සම්බන්ධතාවයක් ඇත.

4 තම පවුල් ඒකකයෙන් මිදීසම වයස් කණ්ඩායම් කෙරෙහි වඩාත් නැඹුරුවීම
රංචු ලැදියාව
යුක්තිය, සාධාරණය සත්‍ය වැනි සංකල්ප ඇගයීම
ස්වීයත්වය ගොඩ නගා ගැනීමට උත්සාහ දැරීම

5 සාමාජීය වර්ධනය
කායික වර්ධනය
චිත්තවේග වර්ධනය
මානසික වර්ධනය

පිළිතුරු

(2.1) කොටස

(1) -1 (2) - 4 (3) -4 (4) -4

## (2.2) කොටස

(1) ප්‍රජනන පද්ධතිය හා එහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පවතින කායික, මානසික හා සමාජීය යහ පැවැත්මය

(2) ලිංගික පරිණතිය හා ප්‍රජනන හැකියා ලැබීම
ප්‍රජනන සෞඛ්‍ය පිළිබදව දැන්වත් බවේ වැදගත්කම
ප්‍රජනන සෞඛ්‍ය කෙරෙහි බලපාන කරුණු
ප්‍රජනන සෞඛ්‍ය රැක ගැනීම

(3) ප්‍රජනන සෞඛ්‍ය කුමක්දැයි යන්න අවබෝධකර ගැනීම
ලිංගික පරිණතිය පිළිබද ප්‍රජනන හැකියා ලැබීම සම්බන්ධව දැනගැනීම
ප්‍රජනන සෞඛ්‍ය පිළිබද නොදැන සිටීම තුලින් යොවුන් දරුවන්ට මුහුණ දීමට සිදුවන අභියෝග පිළිබ!ද දැනගැනීම.
ප්‍රජනන සෞඛ්‍ය රැකගන්නා ආකාරය පිළිබද අවබෝධය ලබාගැනීම

(4) :**HIV) Human immunodeficiency virus**
මානව ප්‍රතිශක්තිකරණ ඌණතා වෛරසය.

.(5) මුත්‍ර මාර්ගයෙන් ස්‍රාව හෝ සැරව පිට වීම
ලිංගාශ්‍රිත ප්‍රදේශයේ තුවාල හෝ දිය බිබිලි ඇතිවීම
මුත්‍ර සහ කිරීමේදී දැවිල්ලක් වේදනාවක් ඇතිවීම
යෝනි මාර්ගයෙන් අධික ලෙස ස්‍රාව හෝ සැරව පිටවීම